**විෂයය - සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය - 10**

**වාරය -02**

**ඒකකය - කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය**

**ඉගෙනුම් පල**

- විවිධ වාක්‍ය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය නිවැරදි ව ලියයි.
- වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ලේඛනයේ යෙදෙයි.
- උක්තය, කර්මය, ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
- විවිධ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

## ක්‍රියාකාරකම i

1 කෙටි පිළිතුරු ලියන්න.

i. භාෂාවක පවත්නා මූලික පද වර්ග නම් කරන්න.
ii. වාක්‍යයක ප්‍රධාන අංග තුන නම් කරන්න.
iii. වාක්‍යයක උක්තය ලෙස පෙනී සිටීමේ හැකියාව පවතින්නේ කවර පදවලට ද?
iv. වාක්‍යයක් නිර්මාණය වන්නේ කෙසේ ද?
v. වාක්‍යයක ප්‍රධාන ව්‍යාකරණාංග දෙක අතර සම්බන්ධය හඳුන්වන නම කුමක් ද?

2 නිවැරදි පද යොදා වගුවේ හිස් කොටු සම්පූර්ණ කරන්න

| උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|
| මම | |
| | අප |
| තෝ/නුඹ/ ඔබ | |
| | තොප |
| ඕ/ඕ තොමෝ/ඈ | |
| සේවකයා | |
| | පාරිභෝගිකයන් |
| | කෘමීන් |

| | |
|---|---|
| ළමයි | |
| | කොකුන් |
| ශිෂ්‍යයෙක් | |
| | ශිෂ්‍යාවක |
| | ගංගාවන් |
| | රීතීන් |
| සිටාණෝ | |

3. පහත සඳහන් වාක්‍යයන්හි උක්ත පද යටින් ඉරි අඳින්න.

i. රාත්‍රී කාලයට බෝ අතුවල එල්ලී ගෙන මාවවුල්ලු බෝ ගෙඩි කති.
ii. මහජනයාගේ සුබසාධනය ගැන කැබිනට් මණ්ඩල සාමාජිකයෝ දීර්ඝ ලෙස සාකච්ඡා කළහ.
iii. වෙසක් මංගල්‍යය අප සිත් බුද්ධාලම්බන ප්‍රීතියෙන් පුරවාලයි.
iv. ගායිකාවක වූ ඈ නිරූපිකාවක ලෙස ද ප්‍රකට ය.
v. උද්ඝෝෂකයන් අතර සිටි යුවතියක් පොලිස් නිලධාරීන්ට තර්ජනය කළා ය.

## ක්‍රියාකාරකම ii

1. දී තිබෙන නිදර්ශනය අනුව වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රථම පුරුෂ | | මධ්‍යම පුරුෂ | | උත්තම පුරුෂ | | අනියමාර්ථ |
|---|---|---|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු | |
| වඩුවෝ | | ✓ | | | | | |
| කුමරිය | | | | | | | |
| නුඹ | | | | | | | |
| අපි | | | | | | | |
| තොපි | | | | | | | |
| ඈ | | | | | | | |
| මල් | | | | | | | |
| ශාස්තෘහු | | | | | | | |
| නිළියක් | | | | | | | |
| නළුවෙක් | | | | | | | |

2. දී ඇති පද අතුරෙන් නිවැරදි ආඛ්‍යාත පදය තෝරා හිස් තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. අම්මා දිය නෑමට වැවට ----------------------
ii. මගියා බස් රථයෙන් බිමට -----------------------
iii. ගංගාවෝ පහළට ගලා -----------------------------
iv. නුඹලා අධිකරණය ඉදිරියේ පෙනී -----------------
v. බැතිමත්හු දෙව්රුව ඉදිරියේ පෙනී -------------------------
vi. කුමරියක පා සලඹ ----------------------------------
vii. ගසේ අතු සුළඟට -----------------------------------
viii. ළමයා කිසිවක් ----------------------
ix. මම සතුන්ට හිංසා --------------------------------
x. තෝ වරදක් -------------------------
xi. තොපි පරිසරය ආරක්ෂා ------------------
xii. අපි දැයේ දරුවන් ------------------------
xiii. ඒ තෙමේ වැඩට ---------------------------
xiv. ඕ තොමෝ දිය ගෙන ඒමට ළිඳට --------------
xv. ඔවුහු තුමූ පෝයට පන්සල් ---------------------

(බසිති, සිටියෙහු, සැලිණි. ගියහ. නොකරයි. කළෙහු. ගියා ය. සුරකිමු. සැලුණා. කළෙහි. බැස්සා ය. සිටියෝ ය. බැස්සේ ය. නොකරමි. ගියේ ය.)

3. සුදුසු ක්‍රියා පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| කර්තෘකාරක<br>ඒක වචන | බහු වචන | කර්මකාරක<br>ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| නටයි | | | නැටෙති |
| | | දිවෙහි/දුවනු ලැබෙහි | |
| | වයමු | | |
| බැලුවා ය/බැලුවේ ය | | | බැලුණු/බලන ලදහ |
| | බැලුවෙහු | | |
| | | | බැලුණුමු/බලන ලදිමු |
| වපුරන්නේ ය<br>/වපුරන්නීය | | | වැපිරෙන්නෝය/වපුරනු<br>ලැබෙන්නෝ ය |
| වපුරන්නෙමි | | | |

## ක්‍රියාකාරකම iii

1. පහත සඳහන් ප්‍රකාශ සදොස් නම් වරහන තුළ x ලකුණ ද නිදොස් නම් ✓ ලකුණ ද යොදන්න.

| | | |
|---|---|---|
| i. | සෑම විට ම ආඛ්‍යාතය උක්ත පදයේ වචන භේදයට අනුරූප වෙයි. | (------) |
| ii. | උක්ත පදයේ ලිංග භේදය බලපාන්නේ කෘදන්ත ක්‍රියාවලට පමණි. | (------) |
| iii. | කර්තෘ අනුක්ත කිරීමට කළ යුතු එක ම දේ විසින් නිපාතය යෙදීම පමණි. | (------) |
| iv. | උක්තය යනු කර්තෘට යෙදෙන තවත් නමකි. | (------) |
| v. | කර්මකාරක වාක්‍යයක ආඛ්‍යාතය තැබිය යුත්තේ කර්තෘට අනුව ය. | (------) |
| vi. | කර්මකාරකයට හැරවිය හැකි වන්නේ සකර්මක වාක්‍ය පමණි. | (------) |
| vii. | කර්තෘ අනුක්ත කළ විට වාක්‍යය කර්මකාරක වෙයි. | (------) |
| viii. | අනියමාර්ථ පුරුෂ ලිංග උක්ත පදය 'එක්' ප්‍රත්‍යයෙන් අවසන් වෙයි. | (------) |
| ix. | අනියමාර්ථ ස්ත්‍රී ලිංග අනුක්ත පදය 'අක්' ප්‍රත්‍යයෙන් අවසන් වෙයි. | (------) |
| x. | 'අකු' යනු අනියමාර්ථ ස්ත්‍රී ලිංග උක්ත ප්‍රත්‍යය වෙයි. | (------) |

2. පහත උක්ත කර්තෘ පද අනුක් කොට ලියන්න.

| | | |
|---|---|---|
| i. | කර්තෘවරයෙක් | ----------------------------------------- |
| ii. | මම | ----------------------------------------- |
| iii. | තෝ | ----------------------------------------- |
| iv. | අපි | ----------------------------------------- |
| v. | ඕ තොමෝ | ----------------------------------------- |
| vi. | හෙතෙම | ----------------------------------------- |
| vii. | සේවිකාවක් | ----------------------------------------- |
| viii. | කම්කරුවෝ | ----------------------------------------- |
| ix. | තොපි | ----------------------------------------- |
| x. | නායකයා | ----------------------------------------- |

3. කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යරටාවන්හි ලක්ෂණවලට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| | කර්තෘ | කර්මය | ක්‍රියා පදය |
|---|---|---|---|
| කර්තෘකාරක වාක්‍යයක | | | |
| කර්මකාරක වාක්‍යයක | | | |

## ක්‍රියාකාරකම iv

1. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

i. ඔහු ශූර කථිකයකු වෙයි.

ii. දරුවෝ අනාගත නායකයන් වන්නෝ ය.
iii. ඔවුහු අවංක මිනිස්සු ද?
iv. සිරකරුවන් ද මනුෂ්‍යයන් ය.
v. වෙළෙන්දෝ විදේශිකයන් ලු
vi. දරුවෝ අපේක්ෂා කරන්නේ මොනවා ද?
vii. ගායකයන් ප්‍රසංගයට පැමිණ ඇත.
viii. වැඩ වර්ජකයන් සේවයට වාර්තා කර නැත්තෝ ය.

2. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

i. විනිශ්චය මණ්ඩලය ලේඛකයාට සම්මානයක් නිර්දේශ කළෝ ය.
ii. ගුරුවරු තොප යහමග යවති.
iii. සොරු මා පැහැර ගත්තෝ ය.
iv. මිත්තණිය නුඹ සනසන්නී ය.
v. දැරියක් විභාගය ඉහළින් සමත් වූවා ය.
vi. මවුපියෝ අප දැඩි ව විශ්වාස කළෝ ය.
vii. ඕ තොමෝ මිහිරි ගීතයක් ගයන්නී ය.

3. පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

i. රියැදුරා විසින් බසය පැදවෙයි.
ii. අප විසින් ගොවියෝ අගයනු ලැබූහ.
iii. නාගරිකයකු විසින් නගර සභාවට එරෙහි ව පැමිණිල්ලක් ඉදිරිපත් කෙරිණි.
iv. විද්‍යාඥයින් විසින් දැරියක් ඇගයෙයි.
v. ගංගාවන් විසින් වියළි බිම් තෙත් කරනු ලැබෙයි.
vi. වෙළෙන්දා විසින් මම රවටන ලදිමි.
vii. කථිකයා විසින් තොපි අගයනු ලැබූහු

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1.

i. නාම පද, ක්‍රියා පද, උපසර්ග පද, නිපාත පද
ii. කර්තෘ, කර්ම, ක්‍රියා
iii. කර්තෘ හා කර්ම පදවලට
iv. පද කීපයක් සම්පූර්ණ අදහසක් ප්‍රකාශ වන පරිදි පිළිගත් රටාවකට අනුව ගැළපීමෙන්
v. උක්ත-ආඛ්‍යාත සම්බන්ධය ලෙස

2. මා, අපි, තා, තොපි, ඇය, සේවකයා, පාරිභෝගිකයෝ, කෘමීහු, ළමයින්, කොක්කු, ශිෂ්‍යයකු, ශිෂ්‍යාවක්, ගංගාවෝ, රිතීහු, සිටාණන්

3.

i. මාවවුල්ලු
ii. සාමාජිකයෝ
iii. වෙසක් මංගල්‍යය
iv. ඈ
v. යුවතියක්

### ක්‍රියාකාරකම ii

1.

| | ප්‍රථම පුරුෂ | | මධ්‍යම පුරුෂ | | උත්තම පුරුෂ | | අනියමාර්ථ |
|---|---|---|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු | |
| වඩුවෝ | | ✓ | | | | | |
| කුමරිය | ✓ | | | | | | |
| නුඹ | | | ✓ | | | ✓ | |
| අපි | | | | | | | |
| තොපි | | | | ✓ | | | |
| ඈ | ✓ | | | | | | |
| මල් | | ✓ | | | | | |
| ශාස්තෘහු | | ✓ | | | | | |
| නිළියක් | ✓ | | | | | | ✓ |
| නළුවෙක් | ✓ | | | | | | ✓ |

2. බැස්සා ය. බැස්සේ ය. බසිති. සිටියෙහු. සිටියෝ ය. සැලුණා. සැලිණි. නො කරයි. නොකරමි. කළෙහි. කළෙහු. සුරකිමු. ගියේ ය. ගියා ය. ගිය හ.

3. 

| | | | |
|---|---|---|---|
| නටති නැටෙයි | | | |
| නටහි නටහු | | | දිවෙහු/දුවනු ලැබෙහු |
| වයමි | | වැයෙමි/වයනු ලැබෙමි | වැයෙමු/වයනු ලැබෙමු |
| බැලුවෝ ය | | බැලිණි/බලන ලදි | |
| බැලුවෙහි | | බැලුණෙහි/බලන ලදිහි | බැලුණෙහු/බලන ලදහු |
| බැලුවෙමි | බැලුවෙමු | බැලිණිමි | |
| | වපුරන්නෝ ය | වැපිරෙන්නේය/වපුරනු ලැබෙන්නේය | |
| | වපුරන්නෙමු | වැපිරෙන්නෙමි/වපුරනු ලැබෙන්නෙමි | වැපිරෙන්නෙමු/ වපුරනු ලැබෙන්නෙමු |

## ක්‍රියාකාරකම iii

1.

| | |
|---|---|
| i | x |
| ii | ✓ |
| iii | x |
| iv | x |
| v | x |
| vi | ✓ |
| vii | x |
| viii | ✓ |
| ix | x |
| x | x |

2. කර්තෘවරයකු විසින්, මා විසින්, තා විසින්, අප විසින්, ඇය විසින්, ඔහු විසින්, සේවිකාවක විසින්, කම්කරුවන් විසින්, තොප විසින්, නායකයා විසින්

3.

| | | |
|---|---|---|
| උක්තයි | අනුක්තයි | කර්තෘකාරකයි |
| අනුක්තයි | උක්තයි | කර්මකාරකයි |

## ක්‍රියාකාරකම iv

1.

i. කවීකයෙක්
ii. නායකයෝ
iii. නිදොස්
iv. සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය.

v. විදේශිකයෝලු
vi. දරුවන්
vii. නිදොස්
viii. නැත

2.

i. විනිශ්චය මණ්ඩලය විසින් ලේඛකයාට සම්මානයක් නිර්දේශ කෙරිණි.
ii. ගුරුවරු විසින් තොපි යහමග යැවෙහු.
iii. සොරුන් විසින් මම පැහැර ගැණිමි.
iv. මිත්තණිය විසින් නුඹ සැනසෙන්නෙහි.
v. දැරියක විසින් විභාගය ඉහළින් සමත් විණි.
vi. මවුපියන් විසින් අපි දැඩි ව විශ්වාස කෙරුණුමු.
vii. ඇය විසින් මිහිරි ගීතයක් ගැයෙන්නේ ය.

3.

i. රියැදුරා  බසය පදවයි.
ii. අපි ගොවියන් ඇගයීමු.
iii. නාගරිකයෙක් නගර සභාවට එරෙහි ව පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය.
iv. විද්‍යාඥයෝ දැරියක අගයයි.
v. ගංගාවෝ වියළි බිම් තෙත් කරති.
vi. වෙළෙන්දා මා රැවටුවේ ය.
vii. කථිකයා තොප ඇගයුවේ ය./ඇගයී ය.